**ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

2026 සැප්තැම්බර් මස 04 දිනැති අංක 2505 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද "**ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026 " නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

I. ඉහත *ගැසට්* නිවේදනයේ අංක 04 වයස සම්බන්ධ ඡේදය පහත පරිදි සංශෝධනය වේ.

2026.10.06 දිනට වයස අවුරුදු විසි දෙකට (22) නොඅඩු විය යුතු අතර, අවුරුදු තිස් පහට (35) නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2004.10.06 දින හෝ ඊට පෙර හා 1991.10.06 දින හෝ ඊට පසුව උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

දැනටමත් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකුනම්, ඔහු/ ඇය වයස අවුරුදු 40ට නොවැඩි විය යුතු අතර (ඒ අනුව 1986.10.06 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අය පමණක්), සතුටුදායක සේවා වාර්තාවක් ද ලබා සිටිය යුතු ය.

II. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.10.30 දක්වා දීර්ඝ කෙරේ. අයදුම්පත් භාර ගැනීම 2026 ඔක්තෝබර් මස 19 වැනි දින පෙ. ව. 9.00 ට විවෘත වන අතර 2026 ඔක්තෝබර් මස 30 වැනි දින ප. ව. 9.00ට අවසන් වේ. ඉහත *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් සියලුම කරුණු එලෙසම බල පවත්නා අතර සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනය ද 2026.10.06 දින ලෙස නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 16 දින,
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය.

10 - 717

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.